**මැදවච්චිය ප්‍රාදේශීය සභාව - 2020**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) උතුරු මැද පළාත් පාලන කොමසාරිස් විසින් 2019 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලද අංක 2019/02 දරන චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නව ගිණුම්කරණ ක්‍රමයට අනුව ඉදිරිපත් කර ඇති බැවින් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තිය ප්‍රකාරව ඉකුත් වර්ෂය සමඟ සැසඳිය නොහැක.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 ජනවාරි 01 දිනට හෙවත් සංක්‍රාන්ති දිනට පැවති ප්‍රත්‍යාගණන කරන ලද වත්කම් ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය පිළිබඳව මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි. | පිළිගනිමි | සංක්‍රාන්ති දිනට පැවති වත්කම් ක්ෂය කිරීම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් කළයුතු වේ. |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුරනැගුම වෙළඳ සංකීර්ණය වෙනුවෙන් 2019 වර්ෂය සඳහා ලැබිය යුතුව තිබුණු කඩකුලී රු.2,595,432 ක් සමුච්චිත අරමුදලට බැර නොකර සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම් එම ප්‍රමාණයෙන් වැඩිවී තිබුණි. | පිළිගනිමි. | පූර්ව කාලපරිච්ඡේදවලට අදාළ ගැලපීම් සමුච්චිත අරමුදල තුළ සිදුකළයුතු වේ. |
| (ආ) | 2019 වර්ෂයේ අවසන් මාස 03 ට අදාළ උසාවි දඩ ආදායම් රු.371,830 ක් සමුච්චිත අරමුදලට බැර කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස විවිධ ආදායම් ගිණුමට බැර කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩිවී තිබුණි. | පිළිගනිමි. | පූර්ව කාලපරිච්ඡේදවලට අදාළ ගැලපීම් සමුච්චිත අරමුදල තුළ සිදුකළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පොදු කටයුතු සඳහා ප්‍රාදේශීය සභාව වෙත පවරා තිබෙන වටිනාකම රු.11,513,000 ක් වූ පර්චස් 14 ක ඉඩම පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | පිළිගනිමි. | සභාවට පවරා දී ඇති වත්කම්වල වටිනාකම් මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් කළයුතු වේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී ඉදිකළ වටිනාකම රු.6,333,388 ක් වූ බෝක්කු 35 ක් මූල්‍ය ප්‍රකාශනවල පුනරාවර්තන වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | පිළිගනිමි. | බෝක්කුවල වටිනාකම මුලධන වියදම් ලෙස ගිණුම්ගත කළයුතු වේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දැන්වීම් පුවරු ආදායම් රු.240,725 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | පිළිගනිමි. | සමාලෝචිත වර්ෂයට අදාළ ආදායම් මූල්‍ය ප්‍රකාශන තුළ දැක්විය යුතු වේ. |
| (ඊ) | බොරළු මාර්ග ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී ලැබුණු රු.29,161,495 ක පුනරාවර්තන ප්‍රදාන, විස්තිරණ ආදායම් ප්‍රකාශයේ, පුනරාවර්තන නොවන ප්‍රදාන ලෙස ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩිවී තිබුණි. | පිළිගනිමි. | බොරළු මාර්ග ඉදිකිරීම් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කළයුතු වේ. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.3,252,323 ක් වූ ගිණුම් විෂයයන් 04 කට අදාළව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කරමි. | අවශ්‍ය විගණන සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1980 අංක 47 දරන පාරිසරික පනතට අනුව 2008 ජනවාරි 25 දින නිකුත් කළ අංක 1533/16 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය | පරිසර බලපත්‍ර ලබානොගෙන සියඹලාගස්කඩ සහ මුස්ලිම් හල්මිල්ලෑව ගව ඝාතකාගාර පවත්වාගෙන ගොස් තිබුණි. | පිළිගනිමි | පාරිසරික පනත ප්‍රකාරව ක්‍රියාකළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1988 අගෝස්තු 23 දිනැති සම්මත අතුරු ව්‍යවස්ථා ගැසට් නිවේදනයේ 32 අතුරු ව්‍යවස්ථාවේ 09 වගන්තිය | සභා බල ප්‍රදේශයේ ගව ඝාතකාගාරවල ඝාතනය වන සතුන් පරීක්ෂා කිරීම හා නිල ලකුණු සටහන් කිරීම සඳහා බලය පවරන ලද මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයෙක් පත්කර මස් පරීක්ෂා කිරීම හා නිල ලකුණු යෙදීම සිදුකර තිබුණු නමුත් ඒ වෙනුවෙන් අයවියයුතු රු.1,042,660 ක ගාස්තු අයකර ගෙන නොතිබුණි. | 2021 වර්ෂයේ සිට අය කිරීමට කටයුතු කර ඇත. | ගැසට් නිවේදනය ප්‍රකාරව ක්‍රියාකළයුතු වේ. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.35,673,108 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,093,356 ක් විය.

**2.2** **මූල්‍ය පාලනය**

**2.2.1** **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,052,214 ක් වූ හිඟ වරිපනම් බදු අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | නීත්‍යානුකූල පදනම සකස් කර ගැනීමෙන් පසු හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟ වරිපනම් අයකර ගැනීමට ක්‍රියා කළයුතු වේ. |
| (ආ) | **කුලී** | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.11,112,436 ක කඩකුලී ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කඩකුලී අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත. | නියමිත දිනට කඩ කුලී අයකර ගැනීමට ක්‍රියා කළයුතු වේ. |
| (ඇ) | **බලපත්‍ර ගාස්තු** | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වෙළඳ බලපත්‍ර ගාස්තු රු.594,900 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු සිදුකරමින් පවතී. | අයකර ගැනීමට ක්‍රියා කළයුතු වේ. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වු කරුණු පහත දැක්වේ .

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුරනැඟුම නව වෙළඳ සංකීර්ණය වෙනුවෙන් වසර 03 ක් සඳහා ලැබී තිබුණු රු.6,803,877 ක තැන්පතු වසර 02 ක් ඉක්මවූ කාලයක සිට නිශ්කාර්යව රාජ්‍ය බැංකු ජංගම ගිණුමක තැන්පත් කර තිබුණි. | ස්ථාවර තැන්පතු ගිණුමක තැන්පත් කිරීමට කඩිනමින් කටයුතු කරමි. | ඵලදායි ලෙස ආයෝජනය කිරීමට ක්‍රියාකළයුතු වේ. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට වසර 01-20 ත් අතර කාලයක සිට අයනොවී පවත්නා දැනට සභාවේ සේවය නොකරන පුද්ගලයන්ගෙන් අයවිය යුතු රු.346,100 ක් වූ සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. | අයකර ගැනීමට ක්‍රියාකළයුතු වේ. |
| (ඇ) | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP) යටතේ මාර්ග ව්‍යාපෘතියක් සඳහා වෙන්කරන ලද රු.7,900,000 ක ප්‍රතිපාදන වලින් රු.3,478,300 ක් එම ව්‍යාපෘතිය සඳහා නොයොදවා LDSP ගිණුම තුළ නිශ්කාර්යව රඳවා තබාගෙන තිබුණි. | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම නිසා මෙම මුදල එම ව්‍යාපෘතිය සඳහා යොදවා නැත | ප්‍රතිපාදන වෙන්කර ගැනීමේදී අදාළ ව්‍යාපෘතිය අයිති කුමන ආයතනයටද යන්න පැහැදිලිව හඳුනාගෙන තිබිය යුතු වේ. |